# අයදුම්පත පිරවීම සඳහා උපදෙස් ලේඛනය

**ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාව - 2026/ 2027**

ඔබගේ අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර කරුණාකර මෙම උපදෙස් හොඳින් කියවන්න.

1. **සුදුසුකම්**

1.1 **ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාව Bachelor of Labour Management (General) – (වසර 03)**

අ. 2000 වසරට පෙර පැවැත්වූ අ.පො.ස (උසස් පෙළ) විභාගයකින් එකවර විෂයයන් හතරටම අවම වශයෙන් සාමන්‍ය (s) සාමාර්ථ ලබා සමත්ව තිබීම හෝ 2000 වර්ෂය හෝ ඊට පසු වර්ෂයක පැවැත්වූ අ.පො.ස (උසස් පෙළ) විභාගයකින් විෂයයන් තුනටම අවම වශයෙන් එකවර සාමාන්‍ය (s) සාමාර්ථ තුනක් ලබා සමත්වීම.

හෝ

ආ. මානව සම්පත් අභිවර්ධන ආයතනය මඟින් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක් මඟින් පිරිනමන ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ (Sri Lanka Qualification Frame Work) තුන්වන මට්ටම් (SLQF Level 3) ඩිප්ලෝමා සහතික පත්‍රයක් ලබා තිබීම.

හෝ

ඇ. මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් ප්‍රදානය කරනු ලබන ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

1.2 වයස අවුරුදු 22 ට නොඅඩු අයෙකු වීම. (සටහන)

සහ

1.3 ඉහත 1.1 අ, ආ දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සපුරාලීමෙන් පසුව වසර දෙකක කාලයක්,

(i) රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියාවක නිරත වූවෙකු වීම. (සටහන)

හෝ

(ii) ස්වයං රැකියාවක නිරත වූවෙකු වීම. (සටහන)

සහ

1.4 උක්ත පාඨමාලාවන් හැදෑරීම සඳහා අයදුම්කරුගේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය මඟින් පවත්වන යෝග්‍යතා පරීක්ෂණයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම අනිවාර්යය වේ. පාඨමාලාව සඳහා තෝරාගැනීමේ සම්පූර්ණ වගකීම මෙම ආයතනය සතු වන අතර, අදාල සියලුම කරුණු පිළිබඳ අවසාන තීරණය ආයතනයේ කළමනාකරණ මණ්ඩලය සතු වේ.

## 2. අයදුම්කරුවන්ගේ වයස හා වසර දෙකක සේවා කාලය නිර්ණය කරන ආකාරය

### 2.1 අයදුම්කරුවන්ගේ වයස නිර්ණය කරන ආකාරය

සෑම අයදුම්කරුවෙකුම 2026.04.06 දිනට වයස අවුරුදු 22ට නොඅඩු අයෙකු විය යුතුය. .

### 2.2 අයදුම්කරුවන්ගේ සේවා කාලය නිර්ණය කරන ආකාරය

- 2026.04.06 දිනට වසර දෙකකට නොඅඩු රාජ්‍ය /පෞද්ගලික ආයතනයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

- ඔබ ස්වයං රැකියාවක නියුක්ත අයදුම්කරුවෙකු නම්, 2026.04.06 දිනට වසර දෙකකට පෙර තම ව්‍යාපාරය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර තිබිය යුතුය.

## 3. තෝරාගැනීම

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.03.31 දින වන අතර එම දිනට ප්‍රථම අයදුම්කරුවන් විසින් තම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

## 4. දේශන පැවැත්වීම

සතියේ දිනවල (සඳුදා සිට සිකුරාදා) දක්වා ප.ව. 05.00 සිට ප.ව. 08.00 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේදී පැවැත්වේ. ඇතැම් දේශන මාර්ගගත ක්‍රමය ඔස්සේ ප.ව. 7.00 සිට 9.30 දක්වා පැවැත්වේ.

විභාග සඳහා සුදුසුකම් ලැබීමට අවම වශයෙන් එක් එක් විෂය සඳහා පවත්වනු ලබන දේශන සඳහා **80%ක දේශන සහභාගීත්වය අනිවාර්ය වේ.**

## 5. ලියාපදිංචි සහ පරිගණක විද්‍යාගාර ගාස්තු

මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඔබගේ පාඨමාලා ගාස්තුවෙන් වැඩි කොටසක් රජය විසින් දරන අතර වසරකට රු. 20,000/- ක වාර්ෂික ලියාපදිංචි වීමේ ගාස්තුවක් පමණක් අය කෙරේ.

## 6. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් නොලබන පාර්ශවයන් වන්නේ,

අ. දැනටමත් ඔබ පිළිගත් විශ්වවිද්‍යාලයක (දේශීය/ විදේශිය) ප්‍රථම උපාධියක් ලබා ඇත්නම් හෝ,

ආ. දැනටමත් ඔබ මෙම විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් විශ්වවිද්‍යාලයක උපාධි, පශ්චාද් උපාධි පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වූ හෝ ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයෙක් නම්,

## 7. විශේෂ කරුණු

7.1 ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන් ශ්‍රම කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවට ලියාපදිංචි විය නොහැක.

7.2 ශ්‍රම කළමනාකරණවේදී උපාධිය පිරිනමන්නේ කොළඹ විශ්වවිද්‍යාලය මඟින් වන අතර, එය වෙනත් පීඨ සහ ආයතන සමඟ පවත්වන වාර්ෂික අභ්‍යන්තර ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවයේදී ප්‍රදානය කෙරේ.

## 8. අයදුම්පත මාර්ගගතව (online) ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පාඨමාලාව සඳහා අයදුම්කිරීම www.ihra.cmb.ac.lk වෙබ් අඩවියට පිවිස මාර්ගගත (online) ක්‍රමය හරහා පමණක් කළ යුතු අතර එසේ අයදුම්කිරීමෙන් අනතුරුව ඔබගේ විද්‍යුත් තැපෑල වෙත ලැබෙන අයදුම්පත්‍රයේ පිටපත blm@ihra.cmb.ac.lk වෙත forward කල යුතුය.

8.1 අයදුම්පත සමඟ උඩුගත (upload) කළ යුතු ලිපිලේඛන වන්නේ,

(i) සේවා ස්ථානයේ ප්‍රධානියාගෙන් ලබා ගත් සේවා කාලය සහ දැනට සේවයේ යෙදී සිටින බවට දැක්වෙන සේවා සහතිකය scan කර උඩුගත කරන්න.

(ii) ස්වයං රැකියාවල නියුක්ත වුවන් පහත සඳහන් ලේඛන Scan කර අයදුම්පත සමඟ උඩුගත කළ යුතුය.

අ. ඔබගේ ව්‍යාපාරය 2026.04.06 දිනට වසර දෙකකට පෙර තමාගේ නමින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇති බව තහවුරු කරන ලද ලේඛනය.

ආ. මේ දක්වා එය අඛණ්ඩව පවත්වාගෙන යන බවට සහතික කර ප්‍රාදේශිය ලේකම්ගේ අනු අත්සන සහිතව පළාතේ ග්‍රාමසේවා නිලධාරියාගෙන් ලබා ගත් සහතිකය.

8.2 පාඨමාලා අයදුම්පත් ගාස්තු වන රුපියල් දෙදහසක මුදල (රු. 2,000.00), මුදල් ගෙවීම් කිරීමට ලබා දී ඇති සබැඳිය හරහා ගෙවීම් කර ලැබෙන රිසිට්පත කර උඩුගත කළ යුතුය.

8.3 විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් අ.පො.ස (උ.පෙ) විභාග සහතිකය Scan කර උඩුගත කරන්න.

8.4 උප්පැන්න සහතිකය Scan කර උඩුගත කරන්න.

**(ඉහත අංක 8.1 (i) හෝ (ii) අ, ආ, 8.3 හා 8.4 ට අදාළ සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ.)**

**9. ශ්‍රම කළමනාකරණයේදී උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරීම.**

9.1 අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට www.ihra.cmb.ac.lk යන වෙබ් අඩවියට පිවිස එහි එන Latest News හෝ Academic Programs හි Apply Online Click කිරීමෙන් අනතුරුව අයදුම් කිරීම සිදු කළ යුතුය.

9.2 අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික **(විභාග දෙපාර්තමේන්තුව නිකුත් කළ)** හා සේවා පළපුරුද්ද සනාථ කිරීමේ සහතිකවල මුල් පිටපත් Scan කොට උඩුගත (PDF Format Only) කළ යුතුය. ඔබ විසින් මෙකී සහතිකවල මුල් පිටපත් සහ සහතික පිටපත් ආයතනය විසින් ඉල්ලූ විට ලබා දීමට වගබලා ගත යුතුය.

9.3 අයදුම්පත්‍රය සමග අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. 2,000/- මුදලක් ගෙවිය යුතු අතර අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී, එකී මුදල් නියමිත පරිදි මුදල් ගෙවීම් කිරීමට ලබා දී ඇති සබැඳිය හරහා ගෙවීම් කර, එම ලැබෙන රිසිට්පත කර උඩුගත කළ යුතුය. මෙහි මුල් පිටපතක් සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේදී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. අයදුම්පත්‍ර ගාස්තු නොගෙවන අයදුම්කරුවන් විභාග ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබයි.

9.4 අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී යම් ගැටලුවක් හෝ තාක්ෂණික දෝෂයක් මතු වන්නේ නම් 0112503393 / 0112581504/ **0768543680** යන දුරකථන අංකයන් හට ඇමතුමක් ලබා දී (පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා) තම ගැටලුව යොමු කර අදාළ උපදෙස් ලබා ගත හැක.

9.5 Online අයදුම්පත්‍රයෙහි සම්පූර්ණ කරන ලද සියලුම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව ඔබ පෞද්ගලිකව වගකිව යුතු අතර එම තොරතුරුවල අසත්‍ය හෝ සාවද්‍යබව මත ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

නියෝජ්‍ය ලේඛකාධිකාරී,
මානව සම්පත් අභිවර්ධන ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය
අංක. 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 07